# ත්‍රිපිටක වර්ගීකරණය හා උදානපාලිය පිළිබඳ අධ්‍යයනයක්

දාපනේ චන්ද්‍රරතන හිමි

In this article it explains the meaning of the *Udāna* while giving brief introduction to the *Udānapāli*. On the other hand data from different sources are collected here to show the similarities of the *Suttās* of *Udānapāli* and others canonical discourses. The content of this article was composed by collecting data from primary and secondary sources. *Udānapāli* belongs to *Khuddaka Nikāya* which contains very short length discourses. '*Udāna'* means delightful utterances made by the Buddha in different occasions. There are some *Udānas* which contains sympathetic utterances of Buddha. There are eight *Vaggās* of *Udānapāli* each *Vagga* contains ten *Suttās*; altogether there are eighty *Suttās* of *Udānapāli*. When it carefully studied the *Udānapāli* it can be understood that *Udānapāli* is a volume composed in the first Buddhist council, but later some commentators have included some teachings there; and also *Udāna* is a volume of *Navaṅga Satthu Sāsana* which considers as the earliest collection of Buddha's teachings. Many discourses of *Udānapāli* are very much similar with other discourse of *Pāli* canon, therefor, in this article categorically shows the list of the *Suttās* of *Udānapāli* and Similar *Suttās* of other places of Pāli canon.

Keywords- *Udānapāli*, Pāli canon and *Navaṅga Satthu Sāsana*

බුද්දක නිකායේ තුන්වන ග්‍රන්ථය ලෙස සැලකෙන උදානපාළිය කෙටි සූත්‍ර ඇතුළත් සංග්‍රහයකි. උදානපාළිය වග්ග අටකින් යුක්ත වේ. එම එක් එක් වග්ගයන් තුළ සූත්‍ර දහය බැගින් අන්තර්ගත වේ. එසේ සංග්‍රහ වූ සූත්‍ර අසූවක් මෙහි අන්තර්ගත වේ. එසේම සෑම සූත්‍රයකටම බුදුන් වහන්සේ විසින් දේශිත උදානයක් ඇත. උදානපාළියෙහි අන්තර්ගත සූත්‍රයන්ගේ ප්‍රධාන කොටස් දෙකක් දැක්විය හැකි ය. එනම් බුදුන් වහන්සේගේ මුවින් ස්වයංජාත උදානගාථා පාඨයන් හා එම උදානයන් ප්‍රකාශ කිරීම නිදානය වූ හේතුව අන්තර්ගත ගද්‍යමය කොටස යන කොටස් දෙකය.[1] සූත්‍රයන් ආරම්භ වන්නේ යම් කිසි අවස්ථාවක් හෝ සිද්ධියක් පිළිබඳව ආඛ්‍යාන ස්වරූපයෙන් ඉදිරිපත් කිරීමෙනි. එම අවස්ථාව හෝ සිද්ධිය සැලකිල්ලට ගෙන බුදුන් වහන්සේ විසින් උදානයන් ප්‍රකාශ කොට ඇත. ''අථඛෝ භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි''.[2] බොහෝ උදානයන් පද්‍යමය ස්වරූපයෙන් ප්‍රකාශ කොට ඇතත් කලාතුරකින් ඇතැම් උදානයන් ගද්‍යමය ස්වරූපයෙන් ද ඉදිරිපත් කොට ඇත. උදානපාළියෙහි අවසාන වග්ගය වන පාටලිගාමිය වග්ගයෙහි අන්තර්ගත පඨමනිබ්බානපටිසංයුක්ත, තතියනිබ්බානපටිසංයුත්ත සූත්‍රය ආදි සූත්‍රයන් ගද්‍යමය උදානයන්ට උදාහරණ වේ.

සමන්තපාසාදිකාවේ සඳහන් වන්නේ ''සොම්නසින් ප්‍රකාශිත'' ගාථා ඇතුළත් සූත්‍ර අසූ දෙකක් උදානපාළියෙහි අන්තර්ගත වී ඇති බවය. එහෙත් වර්තමානයේ දක්නට ලැබෙන උදානපාළියෙහි අන්තර්ගත වී ඇත්තේ සූත්‍ර අසූවක් පමණි. එසේම බුද්ධඝෝෂ හිමියන් දක්වා ඇති පරිදි උදානයක ලක්ෂණ දෙකක් දක්නට ලැබේ. එනම් ගාථාපටිසංයුක්ත බව සහ සෝමනස්සඤාණමය බව යන ලක්ෂණද්වයයි. සොම්නසින්ම පමණක් ප්‍රකාශිත උදානයන් හැරුණු කොට ධර්ම සංවේගයෙන් ප්‍රකාශිත උදානයන් ද උදානපාළියෙහි අන්තර්ගත වේ. මෙයට හොඳම උදාහරණය මුචලින්ද වග්ගයෙහි අන්තර්ගත දණ්ඩ සූත්‍රයයි. එහි සඳහන් පරිදි බුදුන් වහන්සේ ජේතවනයත් සැවැත් නුවර අතර පිණ්ඩපාත චාරිකාවෙහි යෙදෙන විට කුඩා ළමුන් පිරිසක් සර්පයෙකුට හිංසාකරමින් සිටියහ. එහිදී බුදුරජුන් සැප කැමති යමෙක් සැප කැමති අන් අයෙකු දණ්ඩකින් පෙළත් නම් මරණින් පසු හෙතෙම සැපයට පත් නොවේ යන උදානය ප්‍රකාශ කළ සේක. මෙවැනි අවස්ථාවක බුදුරජාණන් වහන්සේ ප්‍රීතියෙන් උද්දාමයට පත්ව සිටි බව කිසිසෙත් විශ්වාස කළ නොහැකි ය. එබැවින් උදානයක් යනු ප්‍රීතිවේගය ප්‍රකාශ කිරීමක් පමණක්ම නොවන බව පැහැදිලි වේ.[3] බුද්ධඝෝෂ හිමියන් මෙන්ම උදානපාළියට අටුවාවක් සපයන ලද ධර්මපාල ආචාර්යවරයා ද (පීතිවෙග සමුට්ඨාපිතො උදාහරො) පෙන්වා දෙන්නේ උදානයන් ප්‍රීතිවේගයෙන් හටගත් ප්‍රකාශයන් ලෙසය. එහෙත් සාරත්ථදීපනී නම් විනය ටීකාව සකස් කරන ලද සාරිපුත්‍ර සංඝරාජ හිමියන් පෙන්වා දෙන්නේ ප්‍රීතිවේගයන් පමණක් නොව ධර්ම සංවේගයන් ලෙසද උදානයන් ප්‍රකාශ විය හැකි බවයි. උදානයන් තෙවැදෑරුම් ලෙස දැක්විය හැකි ය. එනම් සම්මාසම්බුදුවරුන්ගේ උදානයන්, පසේ බුදුවරුන්ගේ උදානයන් හා ශ්‍රාවකයන්ගේ උදානයන් ලෙසිනි. සම්මාසම්බුදුවරුන්ගේ උදානයන්වලට උදාහරණ ලෙස උදානපාළිය දැක්විය හැකි ය. පසේ බුදුවරුන්ගේ උදානයන්ට උදාහරණ ලෙස සුත්ත නිපාතයෙහි ඛග්ගවිසාන සූත්‍රය දැක්විය හැකි ය. එමෙන්ම අපදානපාළියෙහි

ද ශ්‍රාවකයන්ගේ උදානයන් අන්තර්ගත වේ. මෙම උදානයන්ට අමතරව ශක්‍රයා විසින් ප්‍රකාශිත උදාන මෙන්ම බ්‍රාහ්මණ, යක්ෂ, දේව ආදිගේ උදානයන් ද ඇති බව අටුවාචාරීන් පිළිගෙන ඇත.

ත්‍රිපිටකයෙහි අනෙකුත් වර්ගීකරණයන් තුළ අන්තර්ගත බොහෝ කරුණු උදානපාලියෙහි අන්තර්ගත වී ඇත. එබැවින් පළමුවන ධර්මසංගායනාවෙන් පසු සකස්කරන ලද බුද්දක නිකායෙහි ග්‍රන්ථයක් ලෙස සැලකෙන උදානපාලියට ත්‍රිපිටකයෙහි අනෙකුත් සූත්‍රයන්ගේ කරුණු අන්තර්ගත කළේද නැතහොත් බුද්ධ දේශනාවෙහි පැරණිම වර්ගීකරණය ලෙස සැලකෙන නවංගසත්ථු සානයෙහි කොටසක් වූ උදාන කොටසෙහි අන්තර්ගත කරුණු ත්‍රිපිටකයෙහි අනෙකුත් සූත්‍රයන්ට ඇතුළත් කරන ලද්දේ ද එසේත් නැතහොත් ත්‍රිපිටකය වර්ගීකරණය කිරීමේදී මෙන්ම පසුකාලීනව ත්‍රිපිටක වර්ගීකරණයන්ට කොටස් එකතු කිරීමේදී මුලින් සඳහන් කරුණු සැලකිල්ලට නොගෙන, එනම් ගාථාව හෝ ගද්‍ය, කොටස වෙනත් සූත්‍රයක සඳහන් වුවත් එය සැලකිල්ලට නොගෙන ත්‍රිපිටකය ආරක්ෂා කරගැනීමේ ක්‍රමවේදයක් ලෙස ත්‍රිපිටකය විසිරි පැවති ඇතැම් එවැනි උදානයක් එක්වර්ගයක් ලෙස ඉදිරිපත් කිරීමට උදානපාලිය සකස් වූයේද යන මේ කරුණු පිළිබඳව යම් ප්‍රමාණයකට සැකයක් පවතී. කෙසේ වුවත් පුනර්වාචි ස්වභාවය ත්‍රිපිටකයෙහි දක්නට ලැබෙන පොදු ලක්ෂණයකි. බොහෝ විට පසුකාලීනව ත්‍රිපිටකයට එකතු කරන ලද කරුණු නිසා මෙම පුනර්වාචී ස්වභාවය දක්නට ලැබෙන බව අනුමාන කළ හැකි ය. කෙසේ වෙතත් උදානපාලිය බුද්ධ දේශනාව අන්තර්ගත පැරණිම කොටසක් ලෙස උගතුන් විසින් පිළිගනු ලැබේ. එයට ප්‍රධාන සාධකයක් වී ඇත්තේ නවාංගසත්ථුසාසනය තුළ උදාන යනුවෙන් කොටසක් අන්තර්ගත වී තිබීමයි. මහාචාර්ය ඔලිවර් අබේනායක මහතා පෙන්වා දෙන්නේ උදානපාලිය පෞරාණික ග්‍රන්ථයක් ලෙසය. ග්‍රන්ථයක් ලෙස උදානපාලිය සකස්වන විට ධර්ම සංග්‍රාහකයන් සුත්තනිපාතයට අයත් අට්ඨක වර්ගය පිළිබඳ දැනසිටි බව උදානපාලියෙහි සොණවර්ගයෙහි එන කතාපුවතකින් පැහැදිලිවන බව ඔහු පෙන්වා දෙයි. බුදුන් වහන්සේ බැහැදැකීමට අවන්තියේ සිට පැමිණි සොණ තෙරුන් බුදුන් වහන්සේගේ අවසරයෙන් අට්ඨකවග්ගයේ සූත්‍ර දහසය මතකයෙන් සජ්ඣායන කළ බවත් එයට බුදුන් වහන්සේ ප්‍රසංසා කළ බවත් එහි සඳහන් වේ. අට්ඨක වග්ගය පිළිබඳ දැනීමක් උදානපාලිය සකස් කළ අයට තිබූ බව පැහැදිලි වීමෙන් ගම්‍යමානවන්නේ උදානපාලිය සූත්‍ර සංග්‍රහයක් ලෙස සුත්ත නිපාතයටත් වඩා පැරණි බව සිතාගැනීමට තුඩු දෙන සාධකයකි.[4]

උදානපාලියේ අන්තර්ගත බොහෝ උදානයන් ත්‍රිපිටකයෙහි අනෙකුත් වර්ගීකරණයන් තුළද දැකිය හැකි ය. මෙම සමානවර්ගීකරණයන් කොටස් දෙකක් යටතේ දැක්විය හැකි ය. එනම් 1. උදානපාලියෙහි එන ගද්‍යමය කොටස් හා උදානයන් අන්තර්ගත වන ත්‍රිපිටකයෙහි වෙනත් වර්ගීකරණ හා 2. උදානයන් පමණක් අන්තර්ගත වන ත්‍රිපිටකයෙහි අනෙකුත් වර්ගීකරණ යන කොටස් දෙකය. මෙහි පළමුවන වර්ගීකරණය ලෙස සැලකෙන ගද්‍යමය කොටස් බොහෝ සෙයින් විනය පිටකයෙහි ඛන්ධකයන්ගේ හා දී.නි. මහාපරිනිබ්බාන සූත්‍රයෙහි අන්තර්ගත වේ.

01. ගද්‍ය (ආඛ්‍යාන) සහ උදාන අන්තර්ගත ත්‍රිපිටකයෙහි වෙනත් සූත්‍ර

| උදාන | | සමානතාව |
|---|---|---|
| 1. පඨමබෝධි සූත්‍රය | 1-1 | 1. මහාවග්ගපාලි, බෝධි කථා |
| 2. දුතිය බෝධි සූත්‍රය | 1-2 | 2. මහාවග්ගපාලි, බෝධි කථා |
| 3. තතිය බෝධි සූත්‍රය | 1-3 | 3. මහාවග්ගපාලි, බෝධි කථා |
| 4. නිග්‍රොධ සූත්‍රය | 1-4 | 4. මහාවග්ගපාලි, අජපාල කථා |
| 5. මුචලින්ද සූත්‍රය | 2-1 | 5. මහාවග්ගපාලි, මුචලින්ද කථා |
| **6. භද්දිය සූත්‍රය** | **2-10** | **6. සංඝභේදඛන්ධකය, සාක්‍යපබ්බජ්ජකථා (විනය පිටකය)** |
| 7. නාග සූත්‍රය | 4-5 | 7. කෝසම්බක්ඛන්ධකය, පාරිලෙය්‍යකගමන කථා |
| 8. රාජ සූත්‍රය | 5-1 | 8. මල්ලිකා සූත්‍රය, කෝසල සංයුක්ත.ස.නි.3.8 |
| 9. උපොසථ සූත්‍රය | 5-5 | 9. පාතිමෝක්ඛඛන්ධකය, (වි.පි) |
| 10. සෝන සූත්‍රය | 5-6 | 10. චම්මක්ඛන්ධකය. (වි.පි) |
| 11. ආනන්ද සූත්‍රය | 5-8 | 11. සංඝභේදක්ඛන්ධකය.(වි.පි) |
| 12. ආයුසංඛාරෝස්සජ්ජන | 6-1 | 12. මහාපරිනි. සූත්‍රය. (දී.නි.16) ඉද්ධිපාද සංයුක්තය.(ස.නි.81.10) |
| 13. චුන්ද සූත්‍රය | 8-5 | 13. මහාපරිනි. සූත්‍රය (දී.නි.10) |
| 14. පාටලිගාථා සූත්‍රය | 8-6 | 14. මහාපරිනි. සූත්‍රය (දී.නි.10) භෝජ්ජක්ඛන්තකය වි.පි. |

**02. උදාන පමණක් අන්තර්ගත ත්‍රිපිටකයෙහි වෙනත් කොටස්**

| උදාන | | සමානතාව |
|---|---|---|
| 1. කස්සප සූත්‍රය | 1-6 | 1. නිද්.II. අට්ඨකතා ස.නි. 65 |
| 2. ජටිල සූත්‍රය | 1-9 | 2. ධම්මපදය 393 |
| 3. බාහිය සූත්‍රය | 1-10 | 3. බාහියථෙරස්සාපදානම් |
| 4. මුචලින්ද සූත්‍රය | 2-1 | 4. කථාවත්ථු, දුතිවවග්ගෝ I |
| 5. දණ්ඩ සූත්‍රය | 2-3 | 5. ධම්මපද, 131-132 |
| 6. සාරිපුත්ත සූත්‍රය | 3-4 | 6. ථෙරගාථා, සාරිපුත්ත, 999 රේවත 651 |
| 7. පිලින්දිවච්ච සූත්‍රය | 3-6 | 7. ස.නි. 473 |

| | | |
|---|---|---|
| 8. ලෝක සූත්‍රය | 3-10 | 8. ස.නි. 593 සලායතනවිභංග සූත්‍රය<br>ම.නි. 149, සලායතනසංයුක්තය<br>ස.නි. 35-31, ඛන්ධසංයුත්තය<br>ස.නි. 22.41 |
| 9. ගෝපාල සූත්‍රය | 4-3 | 9. ධම්මපදය |
| 10. ජුන්හ සූත්‍රය | 4-4 | 10. ථෙරගාථා, 192 |
| 11. පිණ්ඩෝල සූත්‍රය | 4-6 | 11. මහාපදාන සූත්‍රය දී.නි.<br>ධම්මපද.185 |
| 12. උපසේන සූත්‍රය | 4-9 | 12. ස.නි. 751 |
| 13. කුමාරක සූත්‍රය | 5-4 | 13. ධනපාලසෙට්ඨිපේතවත්ථු 243 |
| 14. උපොසථ සූත්‍රය | 5-5 | 14. ථෙරගාථා 447 සිරිමණ්ඩ |
| 15. රේවත සූත්‍රය | 5-7 | 15. කථාවත්ථු, කණ්ඛාකථා |
| 16. සධායමාන සූත්‍රය | 5-9 | 16. ම.නි. 128 කෝසම්බියජාතකම්, 428 |
| 17. පන්ථක සූත්‍රය | 5-10 | 17. සරභංග ජාතකම් 522 |
| 18. සුභූති සූත්‍රය | 6-7 | 18. ස.නි. 7 |
| 19. දුතියසත්ත සූත්‍රය | 7-4 | 19. ථෙරගාථා 297 රාහුල |
| 20. ලකුණ්ඨභද්දිය සූත්‍රය | 7-5 | 20. චිත්තසංයුක්තය ස.නි. 41.5 |
| 21. තණ්හක්ඛය සූත්‍රය | 7-6 | 21. ධම්මපදය, 230 අ.නි. IV.I. , අ.නි.i.I. |
| 22. පපංචකය සූත්‍රය | 7-7 | 22. ම.නි. 106, අ.නි.VII. I.2 |
| 23. තතියනිබ්බාන සූත්‍රය | 8-3 | 23. ඉතිවුත්තක 43 |
| 24. චතුත්ථනිබ්බාන සූත්‍රය | 8-4 | 24. ඡන්නෝවාද සූත්‍රය ම.නි. 144,<br>සලායතන සංයුක්තය ස.නි. 35.87 |
| 25. දුතියදබ්බ සූත්‍රය | 8-10 | 25. මහාප්‍රජාපතිගෝතමී අපදාන 286-287[5] |

බුදුරජාණන් වහන්සේ විසින් දෙසිත ධර්ම ත්‍රිපිටකය වර්ගීකරණය කිරීමට පූර්වයෙන් නවධර්ම යනුවෙන් කොටස් නවයකට බෙදා දක්වා ඇත. ඒවානම්, සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම සහ වේදල්ල යන කොටස් නවයයි. මෙම කොටස් අතර උදාන ඇතුළුව කොටස් තුනක් ඛුද්දක නිකායෙහි අන්තර්ගත වේ. අනෙක් කොටස් දෙක වනුයේ ඉතිවුත්තක හා ජාතක යන කොටස් දෙකය. එබැවින් මෙම කොටස් අන්තර්ගතව ඛුද්දක නිකාය පසුව සකස්

කරන ලද්දක් ලෙස ඇතැම් උගතුන් පිළිගනු ලැබේ. එබැවින් උදාන, ඉතිවුත්තක හා ජාතක යන කොටස් ඛුද්දක නිකාය සකස් වීමට පෙර සිටම පැවැති බව පැහැදිලි වේ. එහෙත් නවධර්මයන්ගේ අනෙක් කොටස් ත්‍රිපිටකයෙහි ඒ නමින්ම අන්තර්ගත වූ බවත් දක්නට නොමැත. එහෙත් ත්‍රිපිටකය පුරා විසිරී ඇත්තේ එම නව ධර්මවල කොටස් බව ඇතැම්විට අනුමාන කළ හැකි ය.

උදානපාලියෙහි අන්තර්ගත නොවන බුදුන් වහන්සේ විසින් දේශිත බොහෝ උදානයන් විනය පිටකයෙත් සූත්‍ර පිටකයෙත් අන්තර්ගත වේ. උදාහරණයක් ලෙස ජාතකපාලියෙහි සඳහන් බොහෝ ගාථාවන් උදානයන් ලෙස සැලකිය හැකි ය.

උදානපාලිය ධම්මපදය මෙන් ගාථාවලින් (උදානයන්) පමණක් අන්තර්ගත කොට සකසන ලද්දක් ලෙස පවතින්නට ඇති බව ඇතැම් උගතුන් විශ්වාස කරයි. ඒ අනුව මුලින් තිබූ උදානපාලිය ගද්‍යමය වූ ආඛ්‍යානයන්ගෙන් තොරව පද්‍යයන් පමණක් අන්තර්ගත කොට තිබෙන්නට ඇති බව විශ්වාස කෙරේ. ජොන්.ඩී. අයර්ලන්ඩ් පෙන්වා දෙන ආකාරයට උදානපාලියෙහි පළමුවන වග්ගයෙහි ගාථාවන් සියල්ලෙහිම වාගේ 'බ්‍රහ්මණ' යන වචනය අන්තර්ගත වී ඇත. එසේ බ්‍රාහ්මණ යන වචනය සෑම උදානයක මෙන්ම අන්තර්ගත බැවින් එම වග්ගයෙහි ගද්‍යමය වූ ආඛ්‍යාන කොටස් ඉවත්කළ විට වඩා ඉස්මතු වී පෙනෙන්නේ 'බ්‍රාහ්මණ' යන වචනයයි. එබැවින් මුල්කාලීනව ධම්මපදය මෙන් උදානපාලියෙහි පළමුවන පරිච්ඡේදය පදය (උදාන) පමණක් අන්තර්ගත කොට වැඩිවශයෙන් ගාථාවලයෙදී ඇති 'බ්‍රාහ්මණ' යන පදයද සැලකිල්ලට ගෙන එය 'බ්‍රාහ්මණ වග්ග යනුවෙන් හඳුන්වන්නට ඇති බව උපකල්පනය කෙරේ. එසේම උදානපාලියෙහි දෙවැනි වග්ගයෙහි 'සුඛ' යන වචනය උදානයන්හි බොහෝ සෙයින් ඉවත් කොට ඇත. එබැවින් එයද 'සුඛ' වග්ග යන්නට භාවිත කරන්නට ඇතැයි අනුමාන කෙරේ.[6]

අයර්ලන්ඩ් පෙන්වා දෙන ආකාරයට බෝධිවග්ගයෙහි සියලුම උදාන ගාථාවන්හි (එනම් සූත්‍ර දහයෙම ගාථාවල) 'බ්‍රාහ්මණ' යන වචනය අන්තර්ගත වේ. එසේම සුඛ යන වචනය දෙවන වග්ගය වන මුචලින්ද වග්ගයෙහි සියලුම උදාන ගාථාවල අන්තර්ගත වේ. එහෙත් එම වග්ගයෙහි හත්වන සූත්‍රයෙහි අන්තර්ගත උදානයෙහි සුඛ යන වචනය අන්තර්ගත නොවේ. එහෙත් 'සුඛ' යන්නට යම් ප්‍රමාණයට සමානවූ 'පිය' යන වචනය එහි අන්තර්ගත වේ. මෙම කරුණු විශ්ලේෂණය කිරීමෙන් අයර්ලන්ඩ් උත්සාහගෙන ඇත්තේ මුල්කාලීන උදානපාලිය ගාථාවලින් පමණක් සංගෘහිත වූ ග්‍රන්ථයක් ලෙස පවතින්නට ඇති බවයි. පළමුවන හා දෙවන වග්ගවල පමණක් නොව තෙවන වග්ගයෙහිද 'භික්ඛු' යන වචනය උදාන සියල්ලෙහිම පාහේ හතරවන වග්ගය වන මේඝිය වග්ගයෙහි ගාථා එකක් හැරුණු කොට අනෙක් සියල්ලෙහි 'චිත්ත' යන වචනය අන්තර්ගත වී ඇත. මේ අනුව ඉහත අයර්ලන්ඩ්ගේ උපකල්පනය සැලකිල්ලටගෙන සඳහන් කළ හැක්කේ උදානපාලියෙහි තෙවන හා සිව්වන වග්ගයන් ගද්‍ය කොටස් ඉවත් කළ විට ධම්මපද ක්‍රමවේදය සකස් වී යැයි අනුමාන කෙරේ නම් එම වග්ග පිළිවෙළින් භික්ඛු වග්ග හා චිත්තවග්ග ලෙස තිබෙන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය. මෙලෙස සලකා බලන විට ධම්ම පදයෙහි අන්තර්ගත

බ්‍රාහ්මණ වග්ග, සුඛ වග්ග, භික්ඛු වග්ග සහ චිත්ත වග්ග යන වග්ගයන්ගේ නාමයෙන් අන්තර්ගතයෙන් වෙනස් වූ එහෙත් එනමින්ම හැඳින්වෙන වග්ග උදානපාලියෙහි ද මුලිකාලීනව අන්තර්ගත වී තිබූ බව උපකල්පනය කළ හැකි ය. එහෙත් මෙවැනි උපකල්පනයකට පැමිණීම කෙතරම් දුරට විශ්වාසනීය ද යන්න පිළිබඳව සැකයක් පවතී. මෙසේ බැලුවහොත් 'පාප' යන වචනය පස්වන වග්ගයෙහි ගාථා කිපයකට අන්තර්ගත වේ. එබැවින් එය පාප වග්ග යනුවෙන් නම් කළ හැකි ය. එසේම 'දිට්ඨි' යන වචනය හයවන වග්ගයෙහි ගාථා කිපයකට අන්තර්ගත වේ. ඒ අනුව සලකා බලා එය දිට්ඨිවග්ග යනුවෙන් නම් කළ හැකි ය. මේ නයින් බලන කළ අයර්ලන්ඩ්ගේ මතය සම්පූර්ණ වශයෙන් පිළිගත හැකි මතයක් ලෙස සැලකිය නොහැකි ය.

ඉහතින් සඳහන් කළ පරිදි උදානපාලියෙහි උදානයන්ගෙන් බොහෝ ප්‍රමාණයක් පද්‍යයෙන් සංගෘහිත වී ඇත. එහෙත් ගද්‍යයෙන් සංගෘහිත උදානයන් ද අන්තර්ගත වේ. උදානපාලියෙහි අවසාන පරිච්ඡේදයේ අන්තර්ගත මෙම ගද්‍යයන් අසාමාන්‍ය ස්වරූපයක් උසුලන්නේ ගද්‍යයෙන්ම සංගෘහිත වී ඇති නිසා වේ. ඒවා උදානයන් ලෙස බැලූ බැල්මට නොපෙනී යාමය.

උදානපාලිය පිළිබඳව විමසා බැලීමේදී පැහැදිලි වන්නේ එය එක්වරම පළමුවන ධර්මසංගායනාවේදී සංගෘහිත ග්‍රන්ථයක් නොවන බවයි. එයට පැහැදිලිවම උදාහරණ ලෙස ගත හැක්කේ නවාංග සත්ථුසාසනය තුළට උදාන යන කොටස අන්තර්ගත වී තිබීමයි. කෙසේ වෙතත් ජාතක හා ධම්මපද මෙන් උදානයන් මුල්කාලීනව පද්‍යයෙන් පමණක් අන්තර්ගත වී තිබුණැයි සැලකිය හැකි ය. ඊට හේතුව නම් සංගීතිකාරක ථෙරවරුන් විසින් ඇතැම් කරුණු උදානපාලියට ඇතුළත් කරන ලද බව අට්ඨකතාවලින් පැහැදිලි වේ. උදාන අට්ඨකතාවෙහි සඳහන් පරිදි චුන්ද සූත්‍රයෙහි මුල්ගාථා දෙක සංගිතිකාරක ථෙරවරුන් විසින් ඇතුළත් කරන ලද ඒවාය. මෙහි අන්තර්ගත සියලුම නිදාන කතාවන් ඓතිහාසික සිද්ධීන් ලෙස සැලකිය නොහැකි ය. ඇතැම් නිදානයන් උදානයන්ට ගැළපෙන පරිදි සකස් කරන ලද ඒවා බව පැහැදිලි වේ. කෙසේ වෙතත් නවාංගසත්ථු සාසනයෙහිද උදාන යන්න අන්තර්ගත බැවින් උදානපාලිය ත්‍රිපිටකයෙහි පැරණිම ග්‍රන්ථයක් ලෙස පිළිගනු ලැබේ.

**ආන්තික සටහන්**

1 Thanissaro Bhikkhu (2012), *Tr, Udana, Exclamations, A Translation With An Introduction And Notes*, Metta Forest Monastery.P.8)

2 *උදානපාලි*, I. (PTS)

3 මහමිතව පඤ්ඤාරතන, පහලගම ධම්මික, (2009). (සංස්) පාලි අධ්‍යයන විමර්ශන, මහාචාර්ය ඔලිවර් අබේනායක, මාගධී, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, බොරුල්ල: පි. 382

4 මහමිතව පඤ්ඤාරතන, පහලගම ධම්මික, 2009. පි. 385-386

5 Ānandajothi bhikk, (2008) (Tr.) *Udana, Exalted Utterances, Buddha Jayanthi Tripitaka text*. p.7.8.9

6 John D. Ireland, (1997), (tr). *Udana*, Kandy: p.10